# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,228 - 2021 මැයි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2021.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1118 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1133 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජුනි මස 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මැයි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1115- B 82230 — 5,403 (2021/05)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිනී තනතුරු

01. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන සහ දක්ෂිණ මණ්ඩපය සූරියවැව උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී / නිලධාරිනී හෝ ශිෂ්‍ය පොලිස් නිලධාරී/නිලධාරිනී තනතුරු සඳහා 2021.05.10 දින සිට 2021.05.28 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරී තනතුරු හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගන්නා ලදුව, උපාධියට නියමිත හමුදා/පොලිස් සහ අධ්‍යයන විෂයයන් සාර්ථකව නිම කිරීමට සමත් වන කෙඩෙට් නිලධාරී/ නිලධාරිනියන්ට හා ශිෂ්‍ය පොලිස් නිලධාරී/නිලධාරිනියන්ට උපාධි පිරිනැමීම සඳහා, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්වවිද්‍යාලයකි.

03. මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිනි තනතුරුවලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන හිදී පහත පාඨමාලාවන් පැවැත්වේ.

(i) වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධිය අවුරුදු පහයි මාස හය (අවුː 5 1/2) ක්ද,
(ii) විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද,
(iii) නීතිවේදී (එල්.එල්.බී.) උපාධිය අවුරුදු හතරයි මාස හයයි (අවුː4 1/2) ක්ද,
(iv) විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද,
(v) විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද,
(vi) විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවුː 4 1/2) ක්ද,
(vii) විද්‍යාවේදී (බී.එස්.සී.) හටකාර්ය කළමනාකරණ උපාධිය අවුරුදු තුනයි මාස හය (අවුː 3 1/2) ක්ද,
(viii) විද්‍යාවේදී (බී.එස්.සී.) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය අවුරුදු තුනයි මාස හය (අවුː 3 1/2) ක්ද,
(ix) විද්‍යාවේදී (බී.එස්.සී.) සමාජ විද්‍යා උපාධිය අවුරුදු තුනයි මාස හය (අවුː 3 1/2) ක්ද වේ.
(x) විද්‍යාවේදී (බී.එස්.සී.) ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධිය අවුරුදු තුනයි මාස හය (අවුː 3 1/2) ක්ද වේ.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සූරියවැව දක්ෂිණ මණ්ඩපය තුළ පහත පාඨමාලා පැවැත්වේ.

(xi) වාස්තුවිද්‍යාවේදී උපාධිය අවුරුදු පහයි මාස හය (අවුː 5 1/2) ක්ද,
(xii) විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු 4 1/2) ක්ද,
(xiii) විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු 4 1/2) ක්ද,
(xiv) විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධිය අවුරුදු හතරයි මාස හය (අවු 4 1/2) ක්ද, වේ.

ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් සඳහා වන උපාධි පාඨමාලාව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන හිදී පැවැත්වේ.

වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය අවුරුදු පහයි මාස හය (අවුː 5 1/2) ක් ද වේ.

3. 1 උපාධි පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් හා ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් ත්‍රිවිධ හමුදාවට සහ පොලීසියට අනුයුක්ත කිරීම එම හමුදාවල සහ පොලීසියේ ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණවලදී අපේක්ෂකයින් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව පදනම් කොට ගෙන සිදුකෙරෙනු ඇත. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුවල කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ නිත්‍ය බල සේනාවල අධිකාරීලත් තනතුරු සඳහාද ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ තනතුරු සඳහාද පත්කරනු ලැබේ.

3. 2 නියමිත උපාධි පාඨමාලා සහ හමුදා/පොලිස් පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ පරිදි ඔවුනට,

- වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්.බී.බී.එස්.) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) ඉංජිනේරු (ගෞරව) උපාධිය හෝ
- නීතිවේදී (එල්.එල්.බී.) උපාධිය හෝ

- විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී) හටකාර්ය කළමනාකරණ උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී) සමාජ විද්‍යා උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධිය හෝ
- වාස්තුවිද්‍යාවේදී උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය හෝ
- විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධිය හෝ පිරිනමනු ලැබේ

3. 3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

3. 4 තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුකූලව පහත දැක්වෙන උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතුය.

(i). වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු පහයි මාස හයකි. (අවුː 5 1/2) - (කාන්තා/පිරිමි)

2020 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයන් සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් (02) හා සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් (01) සහිතව ජීව විද්‍යා විෂය ධාරාව හදාරානු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් "C" සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

*සැ. යු* : කෙසේ වුවද වයස අවුරුදු 17ට අඩු අයෙකු 2019 වර්ෂයේදී කේම්බ්‍රිජ් /පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනී සිට සුදුසුකම් ලබා තිබුණහොත් එම ප්‍රතිඵල සලකා බලනු ලැබේ.

(ii). විද්‍යාවේදී (බී.එස්.සී) ගගන/ජීව වෛද්‍ය/ සිවිල්/ විදුලි හා විද්‍යුත් / විද්‍යුත් හා විදුලි සංදේශ / නාවික/ යාන්ත්‍රික/මෙකාට්‍රොනික් ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලා : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුː 4 1/2) - (කාන්තා/පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව ගණිතය විෂය ධාරාව හදාරනු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් "B" සාමාර්ථ්‍යය දෙකක් (02) හා "C" සාමාර්ථ්‍යය එකක් (01) සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිටි සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(iii). නීතිවේදී (එල්.එල්.බී.) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුː 4 1/2) - (පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනකට (03) අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනකට (03) අවම වශයෙන් "C" සාමාර්ථ්‍යය 3 ක් සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිටි සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | දේශපාලන විද්‍යාව | කෘෂි විද්‍යාව |
| භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව | උසස් ගණිතය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ඉතිහාසය | ව්‍යාපාර අධ්‍යයනය |
| තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| භෞතික විද්‍යාව | ගණිතය/ සංයුක්ත ගණිතය | |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |

හෝ

2020 හෝ 2019 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයේදී ඉහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයකට (01) හෝ දෙකකට (02) අවම වශයෙන් සම්මාන සාමාර්ථය (C) එකක් හෝ දෙකක් සහ අනෙකුත් විෂය හෝ විෂයයන් සඳහා පහත ලැයිස්තුවෙන් අවම වශයෙන් සම්මාන සාමාර්ථය (C) එකක් හෝ දෙකක් සහ සාමාන්‍ය (S) සාමාර්ථය එකක් (01) සහිතව හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ඉහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයකට (01) හෝ දෙකකට (02) අවම වශයෙන් “C” සාමාර්ථය එකක් හෝ දෙකක් සහ අනෙක් විෂය හෝ විෂයයන් සඳහා පහත ලැයිස්තුවෙන් අවම වශයෙන් සම්මාන “C” සාමාර්ථය එකක් හෝ දෙකක් ලබාගත් සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය / බෞද්ධ ශිෂ්ටාචාරය | දෙමළ | චීන |
| ක්‍රිස්තු ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | සංස්කෘත | අරාබි |
| හින්දු ධර්මය / හින්දු ශිෂ්ටාචාරය | ප්‍රංශ | පාලි |
| ග්‍රීක / ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සිංහල | ඉංග්‍රීසි (විෂයය අංක 73) |
| ඉස්ලාම් / ඉස්ලාම් ශිෂ්ටාචාරය | ජපන් | ජර්මන් |

⋆ ඊට අමතරව අපේක්ෂකයන් අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී සිංහල/දෙමළ විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(**iv**). විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව ඃ කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුඃ 4 1/2) - (පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් පහත සඳහන් විෂයයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් සහිතව ගණිතය විෂය ධාරාව හදාරණු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිටි සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ පහත සඳහන් ඕනෑම විෂයක්
රසායන විද්‍යාව
උසස් ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

(**v**). විද්‍යාවේදී (බී.එස්.සී.) මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලාව ඃ කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුඃ 4 1/2) - (පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් පහත සඳහන් විෂයයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් සහිතව ගණිතය විෂය ධාරාව හදාරණු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිටි සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතුය.

සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ පහත සඳහන් ඕනෑම විෂයක්
රසායන විද්‍යාව
උසස් ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

(vi). විද්‍යාවේදී (බී.එස්.සී.) පරිගණක ඉංජිනේරු (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුඃ 4 1/2) - (පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයෙන් පහත සඳහන් විෂයයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් සහිතව ගණිතය විෂය ධාරාව හදාරණු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිටි සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ පහත සඳහන් ඕනෑම විෂයක්
රසායන විද්‍යාව
උසස් ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

(vii). විද්‍යාවේදී (බී.එස්.සී) භටකාර්ය කළමනාකරණ උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (අවුඃ 3 1/2). - (කාන්තා/පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව හෝ වාණිජ විෂය ධාරාව හදාරානු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(viii). විද්‍යාවේදී (බී.එස්.සී) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (අවුඃ 3 1/2) - (පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා විෂය ධාරාව හෝ ගණිත විෂය ධාරාව හදාරානු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(ix). විද්‍යාවේදී (බී.එස්.සී) සමාජ විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (අවුඃ 3 1/2) - (කාන්තා/පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ඕනෑම විෂය ධාරාවක් හදාරානු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(x). විද්‍යාවේදී (බී.එස්.සී) ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු තුනයි මාස හයකි. (අවුඃ 3 1/2) - (කාන්තා/පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ඕනෑම විෂය ධාරාවක් හදාරානු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් “D” සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(**xi**). වාස්තුවිද්‍යාවේදී උපාධිය : කාලසීමාව අවුරුදු පහයි මාස හයකි. (අවු: 5 1/2 - (කාන්තා/පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) ලබා තිබීම හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් "D" සාමාර්ථ්‍යය තුනක් (03) සහිත කේම්බ්‍රිජ් /පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

i. අවම වශයෙන් පහත ලැයිස්තුවෙන් එක් විෂයයක්
ජීව විද්‍යාව
උසස් ගණිතය
රසායන විද්‍යාව
භෞතික විද්‍යාව
සංයුක්ත ගණිතය
චිත්‍ර
භූගෝල විද්‍යාව

සහ

ii. පහත ලැයිස්තුවෙන් එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක්

| | |
|---|---|
| ගිණුම්කරණය | චීන |
| හින්දු ශිෂ්ටාචාරය | ගෘහ ආර්ථික විද්‍යාව |
| ව්‍යාපාර සංඛ්‍යානය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ඉස්ලාම් ශිෂ්ටාචාරය | ගණිතය |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | සංස්කෘත |
| දේශපාලන විද්‍යාවේ මූලිකාංග | ජර්මන් |
| ඉංග්‍රීසි (විෂය අංක 73) | අරාබි |
| සිංහල | ඉතිහාසය |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | ව්‍යාපාර අධ්‍යයනය |
| සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | ජපන් |
| හින්දි | ආර්ථික විද්‍යාව |
| බෞද්ධ ශිෂ්ටාචාරය | පාලි |
| ප්‍රංශ | දෙමළ |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කෘෂි විද්‍යාව |

සහ

iii. අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ගණිතය විෂයයට සාමාන්‍ය (S) සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) විභාගයෙන් ගණිතය විෂයයට "D" සාමාර්ථ්‍යයක් ලබා තිබීම

සහ

iv. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් පවත්වන අවකාශීය ඥානය පිළිබඳ ඇගයීම් පරීක්ෂණය සමත් විය යුතුය.

(xii). විද්‍යාවේදී (බී.එස්.සී.) ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවු: 04 1/2) - (කාන්තා/පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේදී අපොස (උ/පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) ලබා තිබීම හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී පහත සඳහන් විෂයයන් අතුරින් විෂයන් තුනකට (03) අවම වශයෙන "D" සාමාර්ථ්‍යය තුනක් (03) සහිත කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

පහත දැක්වෙන විෂයයන් අතුරින් අවම වශයෙන් එක් විෂයයකටද:

සංයුක්ත ගණිතය /උසස් ගණිතය

සහ

පහත දැක්වෙන විෂයයන්ගෙන් අනෙකුත් විෂය / විෂයන්ටද පෙනී සිටිය යුතුය.

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | ආර්ථික විද්‍යාව | ව්‍යාපාර සංඛ්‍යානය |
| ව්‍යාපාර අධ්‍යයනය | භෞතික විද්‍යාව | රසායන විද්‍යාව |
| තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය | | |

ඊට අමතරව, අපේක්‍ෂකයන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය.

(අ) ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ්‍යයක්
(ආ) විද්‍යාව විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ්‍යයක්

හෝ

කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Pearson Edexcel O/L) විභාගයෙන් ගණිතය විෂයයට සහ විද්‍යාව විෂයයට "D" සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

(**xiii**). විද්‍යාවේදී (බී.එස්.සී.) මැනුම් විද්‍යා (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුඃ 04 1/2) - (පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ගණිතය විෂය ධාරාව හදාරනු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් "D" සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

(xiv). විද්‍යාවේදී (බී.එස්.සී.) තොරතුරු පද්ධති (ගෞරව) උපාධි පාඨමාලාව : කාලසීමාව අවුරුදු හතරයි මාස හයකි. (අවුඃ 04 1/2) - (පිරිමි)

2020 හෝ 2019 වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන්, අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව ජීව විද්‍යා විෂය ධාරාව, ගණිත විෂය ධාරාව හෝ වාණිජ විෂය ධාරාව හෝ කලා විෂය ධාරාව හදාරානු ලැබූ හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් "D" සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛණයක ලබාගෙන තිබිය යුතුය.

3. 5 තෝරාගනු ලබන කෙඩෙට් නිලධාරීන්/ නිලධාරිනියන් එම පාඨමාලාවට අදාළ පොදු විෂයයන්ට අමතරව ඒ ඒ උපාධි පාඨමාලාවට අදාළ වන පරිදි ඉංග්‍රීසි, කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, නීතිය, අන්තර් ජාතික අධ්‍යයනය හා හමුදා විෂයයන්ද අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

3. 6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳවද පාඨමාලා කාලය තුළදී අඛණ්ඩ පුහුණුවීම්වල යෙදිය යුතුය.

04. (අ) නිලධාරි /නිලධාරිනී තනතුර සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම් ෘ

අයදුම්කරු -

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු වේ.

II. 2021.05.28 වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩි විය යුතු වේ.

III. සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් සමත් වීම (අවම ලකුණු - 30)

IV. විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලැබූවකු විය යුතු වේ.

V. අවිවාහක විය යුතු වේ.

(ආ) අධ්‍යාපන සුදුසුකම් ෘ-

(i) සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබීම සහ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ Cambridge / Edexcel General Certificate of Secondary Education (GCSE) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයයට "C" සාමාර්ථ්‍යයක් ලබා තිබීම අනිවාර්ය වේ.

(ii) ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත සුදුසුකම් ලැබීමට පහත නිර්ණායකයන්ද සපුරා තිබිය යුතුය. සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ්‍ය (C) සහිතව සම්මාන සාමාර්ථ්‍ය (C) 06 සමග අපොස සාමාන්‍ය පෙළ සමත් විය යුතුය. (අතිරේක විෂයයන් සලකා බලනු නොලැබේ) සිංහල හෝ දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය (S) සාමාර්ථ්‍යයක් ලබා තිබිය යුතුය. එහෙත් නීතිවේදී (එල්.එල්.බී) උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා සිංහල හෝ දෙමළ භාෂාව සඳහා සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබිය යුතු වේ.

(iii) විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ කේම්බ්‍රිජ් / පියසන් එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Pearson Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිටි සිසුන් අවම වශයෙන් අපොස (සා/පෙ) විභාගයෙන් සිංහල / දෙමළ භාෂා විෂයට සම්මාන සාමාර්ථ්‍ය (C) ලබා තිබිය යුතුය.

විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවෙකු, අයදුම් කරන මොහොතේදී ඉහත සුදුසුකම සපුරා නොමැති නම් ඔහුව/ඇයව කෙඩෙට් නිලධාරියෙකු ලෙස බඳවාගත් දින සිට වසර දෙකක් ඇතුළත අපොස (සා/පෙ) විභාගයට පෙනීසිට සිංහල/දෙමළ භාෂාව විෂයට සම්මාන සාමාර්ථයක් (C) ලබාගත යුතුයි.

ඉහත සුදුසුකම නියමිත වසර දෙක තුළ ද සපුරනු නොලබන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිණියන් අදාළ සේවයෙන් ඉවත් කරනු ලැබේ.

(iv) අවිවාහක විය යුතු වේ. (උපාධි අපේක්ෂක නිලධාරියෙකුට/ නිලධාරිනියකට පුහුණුවීම් කාලය තුළදී විවාහ වීමට අවසර නොමැති අතර සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

ඈ. පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරා ලිය යුතුය.

| | | යුද | | නාවික | | ගුවන් | | පොලිස් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| උස | වෛද්‍ය | 5' 6" | 5' 3" | සෙ.මී. 168 | සෙ.මී. 160 | 5' 5" සෙ.මී. 165 | 5' 3" සෙ.මී. 160 | 5' 6" | 5' 3" |
| | වෙනත් උපාධි පාඨමාලා | 5' 6" | 5' 3" | සෙ.මී. 168 (සෙ.මී. 171 Provost Branch) | සෙ.මී. 160 (සෙ.මී. 163 Provost Branch) | 5' 6" (සෙ.මී. 167.5) | 5' 4" (සෙ.මී. 162.5) | - | - |
| බර | | කි.ග්‍රෑ. 50 | - | කි.ග්‍රෑ. 52 | කි.ග්‍රෑ. 41 | - | - | - | - |
| ශරීර ස්කන්ධ දර්ශකය | | - | - | - | - | <26 සහ >17 | <25 සහ >17 | - | - |
| පපුව | | 32" (ප්‍රාශ්වාස) | - | 81 cm | - | 32" (අවමය සෙ.මී. 81) | - | 32" (ප්‍රාශ්වාස) | - |

*සටහන* .- යම් අයදුම්කරුවෙකු ජාතික මට්ටමේ ක්‍රීඩා කුසලතා හෝ වර්ණ ලබා ඇත්නම් හෝ ජනාධිපති/අගමැති බාලදක්ෂයෙකු/දක්ෂිකාවක නම් හෝ පාසල් ශිෂ්‍යභට බන්ඩයේ යටත් නිලධාරියෙකු (ජ්‍යෙෂ්ඨ/කනිෂ්ඨ) නම් හෝ ශිෂ්‍යභට සැරයන් හෝ ඉන් ඉහළ තනතුරක් දරා ඇත්නම් ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරන මණ්ඩලය මගින් පත්කරනු ලබන අවසාන සම්මුඛ පරීක්ෂණ තේරීම් කමිටුව විසින් ලිහිල් කිරීමට අවකාශය ඇත.

මෙහිදී ජාතික මට්ටමේ ක්‍රීඩා කුසලතාවයන් යනු යම් අයදුම්කරුවෙකු වයස අවුරුදු 17/19 න් පහළ කාණ්ඩයේ පහත කුසලතා ලබා තිබීම වේ.

කේවල තරඟ - 1 වන/ 2 වන/ 3 වන ස්ථාන
කණ්ඩායම් තරඟ - ශුරතාව / අනුශුරතාව

- ⋆ යම් අයදුම්කරුවෙකු අපොස උසස්පෙළ විභාගයේදී 1.8 හෝ ඊට වැඩි Z අගයක් ලබා ඇත්නම් එවන් අයදුම්කරුවෙකු වෛද්‍ය උපාධි පාඨමාලාව හා ඉංජිනේරු උපාධි පාඨමාලාව සඳහා ඉල්ලුම් කරනවිට අයදුම්කරුගේ/කාරියගේ උස පිරිමි අයදුම්කරුවන් සඳහා 5' 4" හා කාන්තා අයදුම්කාරියන් සඳහා 5' 2" ලෙස ලිහිල් කරනු ලැබේ.

- ⋆ අදාළ සේවාවන් හා ශ්‍රී ලංකා පොලීසිය මගින් නියමකර ඇති දෘෂ්ටි දර්ශණය සඳහා වූ අවම සම්මතයන් සපුරාලීම අත්‍යවශ්‍ය වේ.

ඇ. අයදුම්කරු මනා සෞඛ්‍යය තත්ත්වයක සිටිය යුතු අතර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරන මණ්ඩලයේ සභාපති සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම මෙන්ම පිළිගත් ආකෘතියට අනුව සකසන ලද සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීම අවශ්‍යය වේ. තවද, අධ්‍යයන පාඨමාලාවට තේරී පත්වීමට පෙර යම් අයදුම්කරුවෙක් විසින් සෞඛ්‍යය ප්‍රකාශන හා

පරීක්ෂණ ආකෘති පත්‍රයෙහි අසත්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් එවැනි අයදුම්කරුවෙක් අධ්‍යයන කටයුතු සඳහා නුසුදුස්සකු වන අතර අසත්‍ය තොරතුරු සැපයීම හේතුවෙන් අධ්‍යයන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) ලබා ගත හැකිය.

5. *සේවා කොන්දේසි:-* තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ රත්මලාන හෝ සූරියවැව දක්ෂිණ මණ්ඩපයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් හෝ ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත සහ එම පනතේ සංශෝධනයන්ටද අනුකූලව විශ්වවිද්‍යාලය මගින් කලින් කලට පනවන ලද්දාවූ නීති, රෙගුලාසි සහ නියෝගයන්ට යටත් වනු ඇත. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හෝ ශ්‍රී ලංකා පොලීසියේ පරීක්ෂක ශ්‍රේණියේ තනතුර හා අදාළ උපාධිය ලබා ගැනීමෙන් පසුව අඛණ්ඩ සහ නිරන්තර අනිවාර්ය වසර 12 කට නොඅඩු සේවා කාලයක් සේවය කළ යුතු අතර වෛද්‍ය උපාධි පාඨමාලාව සඳහා බඳවාගනු ලබන අපේක්ෂකයන් අනිවාර්ය වසර 20කට නොඅඩු සේවා කාලයක් සේවය කළ යුතුවේ. තවද උපාධි පාඨමාලාවන් හදාරන කාලය අතරතුරදී වෛද්‍ය හේතුන්මත හෝ වෙනත් ඕනෑම හේතුවක්මත උපාධි පාඨමාලාව හැරයන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් හෝ ශිෂ්‍ය පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් හට කිසිම අයුරකින් උපාධිය ලබානොදීමට කටයුතු කරනු ඇත.

6. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හෝ පොලීසියේ පරීක්ෂක ශ්‍රේණියට පත් කිරීම හා අදාළ උපාධිය ලබා ගැනීමෙන් පසුව එම සේවාවන්ට අදාළ වන පරිදි අනිවාර්ය සේවා කාලයක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුලත් විය යුතුය.

7. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරින්ට/ නිලධාරිනියන්ට හා ශිෂ්‍ය පොලිස් නිලධාරි/නිලධාරිනියන්ට හිමි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ, ශිෂ්‍ය පොලිස් නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ මාසික වැටුප ආසන්න වශයෙන් රු. 40,000/- ක් පමණ වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම්ද සපයනු ලැබේ.

I. ආහාර හා නවාතැන්
II. නිල ඇඳුම්
III. අනුගාමික සේවාවන්
IV. ක්‍රීඩා හා විනෝද පහසුකම්
V. වෛද්‍ය පහසුකම්

8. ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්හි අධිකාරියට හෝ ශ්‍රී ලංකා පොලීසියේ පරීක්ෂක ශ්‍රේණියන් තනතුරට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවිවලට අදාළවන පරිදි එම සේවාවන්හි හෝ ශ්‍රී ලංකා පොලීසියේ බලපාන වැටුප් සහ දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

අ. පහත සඳහන් මාසික දීමනාවන්ද ගෙවනු ලැබේ.

I. සුදුසුකම් දීමනා
II. ආහාර දීමනාව
III. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක් (විවාහක නිලධාරීන්ට පමණක්)
IV. නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව

ආ. පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ./ දීමනා ගෙවනු ලැබේ.

I. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලයේ නේවාසික පහසුකම්
II. කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී
III. නිල ඇඳුම් දීමනා
IV. විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/ අවිවාහක නිලධාරීන්ට අනුගාමික සේවය

9. ශ්‍රී ලංකා යුධ, නාවික, ගුවන් හමුදා සහ පොලිස් නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මගින් පාලනය වනු ඇත.

අ. යුධ හමුදා/නාවික හමුදා/ ගුවන් හමුදා/ පොලිස් වැටුප් සංග්‍රහය

ආ. යුධ හමුදා/ නාවික හමුදා/ගුවන් හමුදා/ පොලිස් නිලධාරීන් උදෙසා ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන වලංගු රෙගුලාසි

ඇ. ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පළ කරන වලංගු යුධ හමුදා/ නාවික හමුදා/ ගුවන් හමුදා සහ පොලිස් විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය

10. පුහුණුවීම් කාලය තුළදී උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ/හෝ අදාළ හමුදාපතිවරු සහ/හෝ පොලිස්පති විසින් නියම කරනු ලබන පුහුණුවීම් වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිලධාරීන්/නිලධාරිනියන් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැකිය.

12. පුහුණුව ලබන උපාධි අපේක්ෂක නිලධාරීන්/නිලධාරිනියන් ඔවුන් සඳහා වෙන් කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතුවේ.

13. *භාෂා අවශ්‍යතා* - තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තා වූද, ඉදිරියේදී පනවනු ලැබිය හැකි වූද, නීතීන්ට අනුකූලව කටයුතු කළ යුතුයි.

14. *අනන්‍යතාවය ඔප්පු කිරීම* :- අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ ගුවන් ගමන් බලපත්‍රය හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. (1) අයදුම්පත් :- මේ සඳහා අයදුම් කළ හැකි වනුයේ මෙම විශ්වවිද්‍යාලයේ නිළ වෙබ් අඩවිය (www.kdu.ac.lk) ඔස්සේ විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම මගින් පමණි. (අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් එකී විද්‍යුත් අයදුම්පතෙහි දක්වා ඇත).තැපැල් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

(11) මෙම විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියේ අදාළ කොටසේ ඇති විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කර එක් උපාධි පාඨමාලාවක් සඳහා නැවත නොගෙවනු ලබන රුපියල් එක්දහස් පන්සියයක (රු. 1500/=) මුදලක් අයදුම්පත් ගාස්තු ලෙස මාර්ගගත ක්‍රමයට (Online Payment) ගෙවිය යුතුය. එලෙස මාර්ගගත ක්‍රමයට ගෙවීමට අපොහොසත්වන අයදුම් කරුවන් ''ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට එක් උපාධි පාඨමාලාවක් සඳහා රුපියල් එක්දහස් පන්සියයක (රු. 1500/=) මුදලක් "උපකුලපති, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, නමින් ලංකා බැංකුවේ "මොරටුව - ඉඩම, ශාඛාවේ අංක "9405831'', ගිණුමට බැර කර, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර විශ්වවිද්‍යාලය වෙත ලබාදිය යුතුය.

16. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන හෝ අයදුම්පත්" කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර, අයදුම්පත් එවීමේදී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ. උපකුලපතිතුමා විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව, ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් සිදු කරනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද අයදුම්කරුවන් පමණක් මූලික සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ.

මෙලෙස ඔබ විසින් සම්පූර්ණ කරනු ලබන විද්‍යුත් අයදුම්පත් 2021.05.28 වෙනි දින හෝ එදිනට පෙරාතුව ලැබෙනසේ විශ්වවිද්‍යාලයේ නිළ වෙබ් අඩවිය ඔස්සේ යොමුකළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත්‍රද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

17. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිලධාරියෙකු/ නිලධාරිනියක අයදුම්පත් ඉදිරිපත්කර, එකී අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත්, ඔහු/ඇය අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බව සඳහන් අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද තිබිය යුතුය.

18. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව, ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් අවශ්‍යයයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ටද පෙනී සිටිය යුතු වේ.

19. සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන, වේලාවන් හා දින විශ්වවිද්‍යාලීය වෙබ් අඩවිය මගින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විශ්වවිද්‍යාලය මගින් ගෙවනු නොලැබේ.

20. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට ඒ පිළිබඳව සහතිකයක් ලබාදීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

21. අයදුම්පත් ලද බැව් මෙම විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලිද පිළිගනු නොලැබේ.

22. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික),
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් සහ
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ
කළමනාකරණ මණ්ඩලයේ සභාපති.

05 - 446

---

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා
බඳවා ගැනීම - 2021

අංක 2088/26 දරන 2018.09.11 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සේවා කොන්දේසි :

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, ''අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්'' තනතුරට තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු යටත් වන්නේ ය.

2.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ට සහ ඊට කරනු ලබන සංශෝධනයන්ට අනුකූලව අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 396 සහ ඊට කරනු ලබන සංශෝධනයන්හි සඳහන් පරිදි අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් තනතුරට අදාළ මට්ටම අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

03. වැටුප :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුරූපව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016.06.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් තනතුරට අදාළ වැටුප් පරිමාණය SL 1-2016 (මාසික) රු.47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 (ආරම්භක වැටුප රු.62595/-) ක් වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

05. සුදුසුකම් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම

සහ

(ආ) 2021.06.07 දිනට වයස අවු. 30 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි වීම ;

සහ

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු වීම හෝ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ 1 වන ශ්‍රේණියේ වසර 07ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම සහ එම තනතුරක ස්ථිර කර තිබීම ;

හෝ

(ඈ) අවුරුදු 07 කට නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියේ යෙදී සිටින නීතීඥවරයෙකු වීම.

*සටහන* :-

I. යම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක නීතීඥවරයෙකු වශයෙන් මාණ්ඩලික තනතුරක හෝ නෛතික තත්ත්වයෙන් හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ නීති විද්‍යාලයක නීතිය පිළිබඳ ගුරුවරයකු වශයෙන් සේවය කරන ලද කාලපරිච්ඡේදයක් "ක්‍රියාකාරීව වෘත්තියෙහි යෙදී සිටි" කාලපරිච්ඡේදයක් වශයෙන් සලකනු ලැබේ.

II. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිරත නිලධරයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(ඉ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඊ) තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*සැ.යු.* - සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2021 ජුනි මස 07 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. මූලික සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව තනතුර සඳහා සුදුස්සෙකු තෝරා ගනු ලැබේ.

07. ඉහත 05 (ඇ) යටතේ වූ සුදුසුකම් මත සේවයට බඳවා ගනු ලබන නිලධරයකු පත්වීමේ දින සිට වසර එකක වැඩ බැලීමේ සේවා කාලයකට යටත් වන්නේය. 05 (ඈ) යටතේ වූ සුදුසුකම් මත සේවයට බඳවා ගනු ලබන නිලධරයකු පත්වීමේ දින සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වන්නේ ය.

08. තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හෝ පත් කරන ලද තනතුරෙහි රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවකුගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

09. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්

වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකල බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරා ගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

10. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත්‍ර ගාස්තුව රු.500/-කි. මෙම මුදල **"අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වේල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යනු ලබන ගිණුම් අංක 297100199025039** ට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත අයදුම්කරුගේ නම ලිපිනය ලියන ලද 9x4 ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග ලියාපදිංචි තැපැල් මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ භාරදීමෙන් අයදුම්පත ලබාගත හැකිය. මුදල් ගෙවීම සඳහා අදාළ ලදුපත සම්පූර්ණ කිරීමේදී ලදුපතේ අදාල ස්ථානයේ අයදුම්කරුගේ නම සහ ලිපිනය සටහන් කළ යුතුය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, **2021.06.11 දින හෝ ඊට පෙර ලැබෙන පිණිස ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12.** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

11. (අ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට්කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(ඇ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

12. මෙම රෙගුලාසිවල සළකා නොමැති කරුණු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2021 මැයි මස 07 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීම - 2021**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. පෞද්ගලික තොරතුරු :

1.1 මුලකුරු සමග නම:.......................................................................................මයා/මිය/මෙය
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) *උදා* : A. P. K. SIRIWARDANA

1.2 සම්පූර්ණ නම:..............................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

1.3 සම්පූර්ණ නම :.............................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................................................................

1.5 පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ...................................................................................................
(සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් ලිපිය මෙම ලිපිනයට එවනු ලැබේ)

1.6 ස්ත්‍රී පුරුෂ භාවය : පුරුෂ - 1 ස්ත්‍රී - 2 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.7 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

1.8 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.9 උපන් දිනය : .......................................

වර්ෂය: [ | | | ] මාසය: [ | ] දිනය: [ | ]

1.10 2021.06.07 දිනට වයස :

අවුරුදු : [ | ] මාස : [ | ] දින: [ | ]

1.11 දුරකථන අංකය :
ස්ථාවර : ................................ ජංගම : ............................... ෆැක්ස් : .............................

02. ශේෂ්ඨාධිකරණයේ /අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු ලෙස (නිවේදනයේ (5ඇ) සුදුසුකම් යටතේ) ඉල්ලුම් කරන්නේ නම්,

2.1 වර්තමාන තනතුරට පත්වූ දිනය :.......................................
2.2 එම තනතුරෙහි ස්ථිර කළ දිනය :...................................................
2.3 2021.06.07 දිනට සේවා කාලය :................................
2.4 සේවා කාලය තුළ යම් කිසි විනයානුකූල දඬුවමකට යටත්ව තිබේද? ..............................................
2.5 එසේ නම් ඒ පිළිබඳව විස්තර :...................................................................................................
2.6 අදාළ කාලය සඳහා සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ....................................................
2.7 උපයාගත් වැටුප් වර්ධක පිළිබඳ විස්තර (වර්ෂයන් අනුපිළිවෙලින් )

| වැටුප් වර්ධක දිනය | වැටුප් පියවර |
|---|---|
| ............................. | .................... |
| ............................. | .................... |
| ............................. | .................... |
| ............................. | .................... |

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයෙකු ලෙස (නිවේදනයේ (5 ඇ) සුදුසුකම් යටතේ) ඉල්ලුම් කරන්නේ නම්,

3.1 අධිකරණ රෙජිස්ට්‍රාර් 1 වන ශ්‍රේණියට පත්වූ දිනය :.......................................
3.2 එම තනතුරෙහි ස්ථිර කළ දිනය :...................................................
3.3 2021.06.07 දිනට අධිකරණ රෙජිස්ට්‍රාර් 1 වන ශ්‍රේණියේ සේවා කාලය :................................
3.4 සේවා කාලය තුළ යම් කිසි විනයානුකූල දඬුවමකට යටත්ව තිබේද? ..............................................
3.5 එසේ නම් ඒ පිළිබඳව විස්තර :...................................................................................................
3.6 අදාළ කාලය සඳහා සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ....................................................
3.7 උපයාගත් වැටුප් වර්ධක පිළිබඳ විස්තර (වර්ෂයන් අනුපිළිවෙලින් )

| *වැටුප් වර්ධක දිනය* | *වැටුප් පියවර* |
|---|---|
| ............................. | .................... |
| ............................. | .................... |
| ............................. | .................... |
| ............................. | .................... |
| ............................. | ..................... |
| ............................. | ..................... |
| ............................. | ..................... |

04. නීතීඥවරයෙකු ලෙස (නිවේදනයේ (5 ඈ) සුදුසුකම් යටතේ) ඉල්ලුම් කරන්නේ නම්,

4.1 නීතීඥවරයෙකු ලෙස දිවුරුම් දුන් දිනය : ..................................................................................

4.2 දැනට ක්‍රියාකාරී ලෙස වෘත්තියෙහි යෙදෙන අධිකරණයන් : .....................................................

4.3 යම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක, පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ නීති විද්‍යාලයක සේවයේ යෙදී සිටින්නේ නම්,

4.3.1 පත්වීම් දිනය :......................................................

4.3.2 තනතුර හා ශ්‍රේණිය :.............................................

4.3.3 තනතුර ස්ථිර කළ දිනය :........................................

4.3.4 දෙපාර්තමේන්තුව හා වර්තමාන සේවා ස්ථානය :......................................................

4.3.5 සේවා කාලය තුළ යම් කිසි විනයානුකූල දඬුවමකට යටත්ව තිබේද? .............................

4.3.6 එසේ නම් ඒ පිළිබඳව විස්තර :................................................................................

05. වෙනත් සුදුසුකම්: ...........................................................................................................................................

06. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐ ..........................................................................................................

07. අයදුම්කරුගේ සහතිකය:

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

..........................
අයදුම්කරුගේ අත්සන.

දිනය : .........................

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

(දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ)

මෙම අයදුම්පත, ඉදිරිපත් කරනු ලබන ........................................................මහතා/මහත්මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

..........................
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය: .........................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :.......................................................................
තනතුර :.......................................................................
ලිපිනය :.......................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම ............................. සේවය කරන ................................................... මහතා/මහත්මිය/මෙනවියට අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය වෘත්තීය සුදුසුකම් ඇති බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදාහරින බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර මේ සමග ඉදිරිපත් කරමි.

දිනය :- දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :-
නිල මුද්‍රාව :-

05- 436

සංශෝධනයයි

**වරාය හා නාවික අමාත්‍යාංශය**

2021.05.07 දින අංක 2227 දරන *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 05- 364 යටතේ පළ වූ වරාය හා නාවික අමාත්‍යාංශයේ මාධ්‍ය අංශය සඳහා තාවකාලික පදනමින් පත් කිරීමට නියමිත ඡායාරූප ශිල්පී සහායක තනතුර හි සඳහන්ව ඇති,

" සේවා ගණය : PL1 ශ්‍රේණිය III " යන්න ඉවත් කර ඇත.

ඩී. එන්. හෙට්ටිආරච්චි,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්.

2021 මැයි මස 11 වැනි දින.

05- 448

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ) ඛණ්ඩ - 03 සේවා ගණයේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා (සීමිත) බඳවා ගැනීම - 2021**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා, පහත ක්ෂේත්‍රයන්හි නියමිත සුදුසුකම් සපුරා ඇති කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL 3-2016)ට අයත් තනතුරුවල නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *ක්ෂේත්‍රය* |
|---|
| ලෝහ වැඩ ශිල්පය |
| මෝටර් යාන්ත්‍රික ශිල්පය |
| විදුලි ශිල්පය |
| ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය<br>(ඇළුමිනියම් පිළිසකරකරණය) |

*01. බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබූවන්ගෙන්, පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. අංක 06හි සඳහන් විෂය නිර්දේශය යටතේ අයදුම් කරන ක්ෂේත්‍රයට අදාළ දැනුම මැන බලන ප්‍රශ්න පත්‍රයකට හා සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය මැන බලන ප්‍රශ්න පත්‍රයකට සියලු අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය. අංක 07හි සඳහන් ලකුණුදීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වේ.

*02. අවශ්‍ය සුදුසුකම් :*

I. *අධ්‍යාපන සුදුසුකම් :*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථයක් සහිතව එක් වරකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත් වී තිබීම.

II. *වෘත්තීය සුදුසුකම් :*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) 4 වන මට්ටමේ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම **;**

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ලෝහ වැඩ ශිල්පය (වෑද්දුම්/පෑස්සුම්)/ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය/මෝටර් යාන්ත්‍රික ශිල්පය/විදුලි ශිල්පය පිළිබඳව අවුරුදු එකක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවක් (පූර්ණකාලීන/අර්ධකාලීන) හදාරා සහතිකයක් ලබා තිබීම.

ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්ප ප්‍රදර්ශක තනතුරු සඳහා අයදුම්කරන්නන් අතුරින් යම් අයදුම්කරුවෙකු ඇළුමිනියම් පිළිසකරකරණය පිළිබඳ නිපුණතාවය ලබාගෙන ඇත්නම් එවැනි අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

III. *පළපුරුද්ද :*

අයදුම්පත් කැඳවන දිනට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL 3-2016) ට අයත් තනතුරක ස්ථිර පත්වීමක් ලැබ යටත් පිරිසෙයින් අවුරුදු 07ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

IV. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

V. *වෙනත් :*

අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කොට තිබිය යුතුය.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

I. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

II. පත්වීම අවුරුදු එකක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ය. ශිල්ප ප්‍රදර්ශක III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව දැනට දරන තනතුරට අදළ ප්‍රවීණතාවය ලබා තිබුණද මෙම තනතුරට අදළ අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදළ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

*04. වයස් සීමාව :*

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 25ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස් සීමාවක් නැත.

*05. වැටුප් පරිමාණය :*

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි MT 1-2016 වැටුප් බණ්ඩය යටතේ මෙම තනතුරට රු. 29,840 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු. 48,890ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

*06. ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ අංකය* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| 1 | සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | කාලීන, සමාජීය සිදුවීම් පිළිබඳ අවබෝධය හා අන්තර්ජාතික සිදුවීම් පිළිබඳ දැනුම හා නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව හා විශ්ලේෂණාත්මක හැකියාව මැන බැලීමට අදාළ කෙටි ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40% |
| 2 | ලෝහ වැඩ ශිල්පය | ඉංජිනේරු විද්‍යාව, සන්නිවේදන හැකියාව, කාර්මික ඇඳීම. වෑද්දුම් යාන්ත්‍රණ ශිල්පය (න්‍යාය), වාත්තු වැඩ | පැය 02 | 100 | 40% |
| 3 | විදුලි ශිල්පය | විදුලි යන්ත්‍ර, බල විද්‍යුතය හා ස්වයංචල පාලන පද්ධති, ක්ෂුද්‍ර සැකසුම් පාදක පද්ධති, ව්‍යවහාරික විදුලි මිණුම්, විදුලි රැහැන් ඇඳීම. | පැය 02 | 100 | 40% |
| 4 | ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය | ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කිරීම, ඉදිකිරීම් බිම් මැනීම, ජලය පිරිපහදුව හා කසල ජලය බැහැර ලීම, ව්‍යුහ න්‍යාය හා සැලසුම්, ප්‍රමාණ සමීක්ෂණය, ඇළුමිනියම් පිළිසකරකරණය. | පැය 02 | 100 | 40% |
| 5 | මෝටර් යාන්ත්‍රික ශිල්පය | ඉංජිනේරු ඇඳීම හා නිර්මාණය, නිෂ්පාදන තාක්ෂණය, යාන්ත්‍රික නඩත්තුව හා බලශක්ති කළමනාකරණය, ස්වයංචල තාක්ෂණය, පෙට්‍රල්/ඩීසල් එන්ජින්, මෝටර් රථ විදුලි කාර්මික | පැය 02 | 100 | 40% |

*07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍රයන් :*

| *ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| 3. අතිරේක පළපුරුද්ද | 30 |
| 4. භාෂා ප්‍රවීණතාවය | 10 |
| 5. පරිගණක හැකියාව | 10 |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 |
| **එකතුව** | 100 |

*08. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

*09. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

I. මෙහි පහත දක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 07 දක්වා පළමුවන පිටුවට ද, අංක 08 සිට 10 දක්වා දෙවැනි පිටුවටද අනිකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන සේ සකස් කර ගත් අයදුම්පත් තම අත්අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කොට "අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ.පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ - 10" යන ලිපිනයට 2021.06.07 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා අයදුම්පත්‍රය (සීමිත) යන්න පැහැදිලිව ලියා තිබිය යුතුය.

II. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

III. විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුවේ.

IV. විභාග ගාස්තුව රු. 650ක් වන අතර එම ගාස්තුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අංක 176-100-139026228 දරන ගිණුමට යැවෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙන සේ ඇලවිය යුතුය. ඔබගේ අයදුම්පත්‍රයේ හා කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු අපාසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

V. තම අයදුම්පත් තමන් සේවය කරන ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

VI. දෙපාර්තමේන්තුවේ කිසිවකුගේ නමට අයදුම්පත් නොඑවිය යුතු අතර එසේ එවන හෝ අතින් ගෙනැවිත් භාරදෙන හෝ අයදුම්පත් කිසිවක් භාරගනු නොලැබේ. යම් අයදුම්පතක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ වන පැමිණිලි කිසිවක් සලකා බලනු නොලබන අතර අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

*10. විභාග පටිපාටිය :*

I. විධිමත් ලෙස අයදුම්පත් එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු/අපේක්ෂිකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

II. මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

III. තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා,

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත්කළ ජාතික හැඳුනුම්පත හෝ
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

පමණක් පිළිගැනේ.

IV. විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

V. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාග යට පෙනී සිටීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභගායට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

VI. විභාගය පැවැත්වීම සම්න්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

VII. මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය විසින් කොළඹදී පමණක් පවත්වනු ලැබේ.

*11. සාවද්‍ය තොරතුරු සැපයීම :*

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

එස්. සී. ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්,

2021 මැයි මස 03 වැනි දින,
කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 557,
ඕල්කොට් මාවත,
කොළඹ - 10.

**ආදර්ශ අයදුම් පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ) ඛණ්ඩ - 03 සේවා ගණයේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා (සීමිත) බඳවා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය

| | |
|---|---|
| අයදුම් කරන ක්ෂේත්‍රය | |
| අයදුම් කරන මාධ්‍යය | |

1. අයදුම්කරුගේ නම ඃ

I. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

II. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ඃ :—————.

III. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) ඃ :—————.

2. දැනට දරන තනතුර :—————.

I. එම තනතුරට පත්වූ දිනය ඃ අවුරුද්ද :—————. මාසය :—————. දිනය :—————.

II. අයදුම්පත් භාරගන්නා අවසාන දින එම තනතුරෙහි සේවා කාලය ඃ

අවුරුද්ද :—————. මාසය :—————. දිනය :—————.

3. ලිපිනය හා දුරකථන අංකය ඃ

I. කාර්යාලීය ලිපිනය :—————.

දුරකථන අංකය :

II. පෞද්ගලික ලිපිනය :—————.

දුරකථන අංකය :

ජංගම දුරකථන අංකය :

(ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතුය.)

4. උපන් දිනය :

අවුරුද්ද : | | | | | මාසය : | | | දිනය : | | |

5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : | | | | | මාස : | | | දින : | | |

6. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

7. ස්ත්‍රී / පුරුෂ භාවය :—————.

8. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :—————.

9. අධ්‍යාපන සුදුසුකම් :—————.

අ.පො.ස. (සා.පෙ.) විභාගය :

වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උ.පෙ.) විභාගය :

වර්ෂය :—————. විභාග අංකය :—————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

10. වෘත්තීය සුදුසුකම් :

| විභාගය/ඩිප්ලෝමාව | වර්ෂය | පෙනීසිටි විෂයයන් | සාමාර්ථය | ආයතනයේ/ විශ්වවිද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

11. පළපුරුද්ද පිළිබඳ විස්තරය :

| සේවය කළ ආයතනය | තනතුර | සේවය කළ කාලය | රාජ්‍ය අංශය/අර්ධ රාජ්‍ය අංශය/පෞද්ගලික අංශය යන වග |
|---|---|---|---|
| | | | |

12. පරිගණක හැකියාව පිළිබඳව ලබා ඇති ප්‍රවීණතාවයන්

ඩිප්ලෝමාව

සහතික පත්‍ර පාඨමාලාව

13. ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ඇති ප්‍රවීණතාවය

ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව

ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව

14. විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව :—————.

මුදල් ගෙවූ දිනය :—————.

| කුවිතාන්සිය නොගැලවෙන සේ අමුණා එවිය යුතුය. |
|---|

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත්වන බවත්, පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත්වන බවත් මම දනිමි.

.......................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ...................................... තාක්ෂණ/කාර්මික විද්‍යාලයේ/ප්‍රධාන කාර්යාලයේ සේවය කරන .................................................... මයා/මිය/මෙනවිය දැනට ..................................................................... තනතුරේ සේවය කරන

බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත් විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන තැබූ බවත් සහතික කරමි.

........................................................,
අධ්‍යක්ෂ/විදුහල්පති/අංශ ප්‍රධානියාගේ අත්සන.

දිනය:—————.
නිල මුද්‍රාව

05 - 267/1

---

**නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ) ඛණ්ඩ - 03 සේවා ගණයේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා (විවෘත) බඳවා ගැනීම - 2021**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා, පහත ක්ෂේත්‍රයන්හි නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *ක්ෂේත්‍රය* |
|---|
| ලෝහ වැඩ ශිල්පය. |
| මෝටර් යාන්ත්‍රික ශිල්පය |
| විදුලි ශිල්පය |
| ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය<br>(ඇළුමිනියම් පිළිසකරකරණය) |

*01. බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබූවන්ගෙන්, පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. අංක 06හි සඳහන් විෂය නිර්දේශය යටතේ අයදුම් කරන ක්ෂේත්‍රයට අදළ දැනුම මැන බලන ප්‍රශ්න පත්‍රයකට හා සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය මැන බලන ප්‍රශ්න පත්‍රයකට සියලු අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය. අංක 07හි සඳහන් ලකුණුදීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වේ.

*02. අවශ්‍ය සුදුසුකම් :*

I. අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත් වී තිබීම.

II. වෘත්තීය සුදුසුකම් :

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තිය කුසලතාවයන්හි (**NVQ**) 5 වන මට්ටමේ තනතුරට අදළ විෂය ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදරා සහතිකයක් ලබා තිබීම ;

හෝ

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ලෝහ වැඩ ශිල්පය (වෑද්දුම්/පෑස්සුම්) ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය/මෝටර් යාන්ත්‍රික ශිල්පය/විදුලි ශිල්පය පිළිබඳව අවුරුදු තුනක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවක් (පූර්ණකාලීන/අර්ධකාලීන) හදාරා සහතිකයක් ලබා තිබීම.

ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්ප ප්‍රදර්ශක තනතුරු සඳහා අයදුම්කරන්නන් අතුරින් යම් අයදුම්කරුවෙකු ඇළුමිනියම් පිළිසකරකරනය පිළිබඳ නිපුණතාවය ලබාගෙන ඇත්නම් එවැනි අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

III. පළපුරුද්ද ;

රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක තනතුරට අදළ ක්ෂේත්‍රයේ වසර 01කට නොඅඩු කාලයක් සේවයේ යෙදී පළපුරුද්දක් තිබීම.

IV. කායික සුදුසුකම් ;

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

V. වෙනත් ;

* ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
* අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
* අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කොට තිබිය යුතුය.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි*

I. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

II. පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත්ය. ශිල්ප ප්‍රදර්ශක III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට පත්ව වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

*04. වයස් සීමාව :*

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

*05. වැටුප් පරිමාණය:*

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි MT 1-2016 වැටුප් බාණ්ඩය යටතේ මෙම තනතුරට රු. 29,840 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - රු. 48,890ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

*06. ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ අංකය* | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| 1 | සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | කාලීන, සාමාජීය සිදුවීම් පිළිබඳ අවබෝධය හා අන්තර්ජාතික සිදුවීම් පිළිබඳ දැනුම හා නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව හා විශ්ලේෂණාත්මක හැකියාව මැන බැලීමට අදාළ කෙටි ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40% |
| 2 | ලෝහ වැඩ ශිල්පය | ඉංජිනේරු විද්‍යාව, සන්නිවේදන හැකියාව, කාර්මික ඇඳීම. වෑද්දුම් යාන්ත්‍රණ ශිල්පය (න්‍යාය), වෘත්තු වැඩ | පැය 02 | 100 | 40% |
| 3 | මෝටර් යාන්ත්‍රික ශිල්පය | ඉංජිනේරු ඇඳීම හා නිර්මාණය, නිෂ්පාදන තාක්ෂණය, යාන්ත්‍රික නඩත්තුව හා බලශක්ති කළමනාකරණය, ස්වයංචල තාක්ෂණය, පෙට්‍රල් /ඩීසල් එන්ජින්, මෝටර් රථ විදුලි කාර්මික | පැය 02 | 100 | 40% |
| 4 | විදුලි ශිල්පය | විදුලි යන්ත්‍ර, බල විද්‍යුතය හා ස්වයංචල පාලන පද්ධති, ක්ෂුද්‍ර සැකසුම් පාදක පද්ධති, ව්‍යවහාරික විදුලි මිණුම්, විදුලි රැහැන් ඇදීම. | පැය 02 | 100 | 40% |
| 5 | ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පය | ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කිරීම, ඉදිකිරීම් බිම් මැනීම, ජලය පිරිපහදුව හා කසල ජලය බැහැර ලීම, ව්‍යුහ න්‍යාය හා සැලසුම්, ප්‍රමාණ සමීක්ෂණය, ඇළුමිනියම් පිළිසකරකරණය. | පැය 02 | 100 | 40% |

*07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍රයන් :*

| *ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| 2. අතිරේක වෘත්තිය සුදුසුකම් | 20 |
| 3. අතිරේක පළපුරුද්ද | 30 |
| 4. භාෂා ප්‍රවීණතාවය | 10 |
| 5. පරිගණක හැකියාව | 10 |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 |
| **එකතුව** | 100 |

*08. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

*09. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

I. මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 07 දක්වා පළමුවන පිටුවට ද, අංක 08 සිට 10 දක්වා දෙවැනි පිටුවටද අනිකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන සේ සකස් කර ගත් අයදුම්පත් තම අත්අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කොට ''අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ.පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ - 10'' යන ලිපිනයට 2021.06.07 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා අයදුම්පත්‍රය (විවෘත)'' යන්න පැහැදිලිව ලියා තිබිය යුතුය.

II. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

III. විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුවේ.

IV. විභාග ගාස්තුව රු. 650ක් වන අතර එම ගාස්තුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අංක 176-100-139026228 දරන ගිණුමට යැවෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙන සේ ඇලවිය යුතුය. ඔබගේ අයදුම්පත්‍රයේ හා කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

V. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 41,580ක මාසික ඒකාබද්ධ වැටුප් තලයක් (රා.ප.ච. 03/2016 I උපලේඛනය අනුව) ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

VI. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

VII. දෙපාර්තමේන්තුවේ කිසිවකුගේ නමට අයදුම්පත් නොඑවිය යුතු අතර එසේ එවන හෝ අතින් ගෙනැවිත් භාරදෙන හෝ අයදුම්පත් භාරගනු නොලැබේ. යම් අයදුම්පතක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ වන පැමිණිලි සලකා බලනු නොලබන අතර අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

*10. විභාග පටිපාටිය :*

I. විධිමත් ලෙස අයදුම්පත් එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු/අපේක්ෂිකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

II. මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

III. තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා,

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත්කළ ජාතික හැඳුනුම්පත *හෝ*

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය, *හෝ*

පමණක් පිළිගැනේ.

IV. විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

V. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

VI. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

VII. මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය විසින් කොළඹදී පමණක් පවත්වනු ලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

එස්. සී. ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්.

2021 මැයි මස 03 වැනි දින,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 557,
ඕල්කොට් මාවත,
කොළඹ - 10.

**ආදර්ශ අයදුම් පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණ) බණ්ඩ - 03 සේවා ගණයේ ශිල්ප ප්‍රදර්ශක තනතුර සඳහා (විවෘත) බඳවා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය

| | |
|---|---|
| අයදුම්කරන ක්ෂේත්‍රය | |
| අයදුම්කරන මාධ්‍යය | |

1. අයදුම්කරුගේ නම :

I. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

II. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

III. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ලිපිනය හා දුරකථන අංකය :

I. කාර්යාලීය ලිපිනය :————.

දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

II. පෞද්ගලික ලිපිනය :————.

දුරකථන අංකය :

ජංගම දුරකථන අංකය :

(ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතුය.)

3. උපන් දිනය :

අවුරුද්ද : මාසය : දිනය :

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වයස :

අවුරුදු : මාස : දින :

5. ජාතික හැඳුනුම්පත් අංකය :

6. ස්ත්‍රී / පුරුෂ භාවය :————.

7. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා.පෙ.) විභාගය :

වර්ෂය : ....................විභාග අංකය :.......................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උ.පෙ.) විභාගය :

වර්ෂය : ....................විභාග අංකය :.......................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

9. වෘත්තීය සුදුසුකම් ෑ

| සහතික පත්‍ර/ඩිප්ලෝමා/ උපාධි හෝ වෙනත් සුදුසුකම් | වර්ෂය | පෙනීසිටි විෂයයන් | සාමාර්ථය | ආයතනයේ/ විශ්ව විද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තරය ෑ

| සේවය කළ ආයතනය | තනතුර | සේවය කළ කාලය | රාජ්‍ය අංශය/අර්ධ රාජ්‍ය අංශය/පෞද්ගලික අංශය යන වග |
|---|---|---|---|
| | | | |

11. පරිගණක හැකියාව පිළිබඳව ලබා ඇති ප්‍රවීණතාවයන් ෑ

ඩිප්ලෝමාව :————.

සහතික පත්‍ර පාඨමාලාව :————.

12. ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ඇති ප්‍රවීණතාවය ෑ

ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව :————.

ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව :————.

13. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කර තිබේ ද? :————.

14. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද? :————

15. විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව :————.

මුදල් ගෙවූ දිනය :————

| කුවිතාන්සිය නොගැලවෙන සේ අමුණා එවිය යුතුය |
|---|

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත්වන බවත්, පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත්වන බවත් මම දනිමි.

.......................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................ මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ...................................... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

..........................
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :..........................

(මෙම කොටස අදාළ වනුයේ රජයේ රැකියාවක නියුක්ත වුවන්ට පමණි).

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ...................................................................... මයා/මිය මෙනවිය, දැනට ........................................... තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත් විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

.........................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය
පැවරුණු නිලධාරියගේ අත්සන.

දිනය :..........................
(නිල මුද්‍රාව)

05 - 267/2

---

## ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021 ජූලි

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.මෙම විභාගය කොළඹ දී පැවැත්වේ.

1. ආයුර්වේද කොමසාරිස් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

2. ඉල්ලුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතිවලට අනුකූලව සකස් කර එවිය යුතුය.එම ආදර්ශ ආකෘතිය අනුව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට අදාළව සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් ස්වකීය අයදුම් පත්‍රය පිළියෙල කළ යුතු අතර, එම අයදුම් පත්‍රය අපේක්ෂකයින් විසින් සිය ආයතන ප්‍රධානියා මගින් **2021.05.28** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ " **ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම** "යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ '' **ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021 ජූලි** " යනුවෙන් සඳහන් විය යුතුය. අයදුම් පත්‍රය කැඳවන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. පළමු වරට මෙම විභාගයට පෙනී සිටීමට කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත්, ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු.230/- ක් වටිනා මුදල් ගාස්තුවක් ද, එක් විෂයක් සඳහා පෙනී සිටින්නේ නම් රු.57.50ක් වටිනා මුදල් ගාස්තුවක් ද ගෙවිය යුතු වේ. එම ගෙවිය යුතු මුදල මහරගම ලංකා බැංකු ශාඛාවේ අංක 7041294 ආයුර්වේද කොමසාරිස්ගේ ගිණුමට බැර කර ලදුපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය.කුමන කරුණක් යටතේ වුවද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

4. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය:**

අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී සහ පෙනී සිටින සෑම විෂයක් පාසාම ආයුර්වේද දෙපාර්තමේන්තුව සෑහිමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතරින් කුමක් වුවත් භාර ගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

5. 2020.10.27 ට පෙර පත්වීම් ගත් වෛද්‍ය නිලධාරීන්ට පමණක් මෙම පරීක්ෂණයට අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. (අංක 2199/10 හා 2020.10.27 දිනැති *ගැසට් නිවේදනය* මගින් ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන බැවින්, එහි 8.3 වගන්තිය ප්‍රකාරව.)

06. අයදුම්පත් පිළිගන්නා ලද නිලධාරීන් වෙත ආයුර්වේද කොමසාරිස් විසින් විභාග කාලසටහන සහ ප්‍රවේශ පත්‍රය නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් තම අත්සන නියමිත පරිදි සහතික කරවා ගන්නා ලද ප්‍රවේශපත්‍රය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකට (07) පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව පහත සඳහන් විස්තර සමග "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම " යන ලිපිනයට වහාම දැන්විය යුතුය.

(i) විභාගයේ නම :
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම:
(iii) අයදුම්කරුගේ ලිපිනය:
(iv) අයදුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලයේ නම සහ ලියාපදිංචි කුවිතාන්සියේ අංකය හා දිනය:

7. විභාග පටිපාටිය :
(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් සේවා ව්‍යවස්ථාවට අනුකූලව)

I. මුදල් රෙගුලාසි - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්,

i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ i වැනි කාණ්ඩය ( 10 පරිච්ඡේදය හැර)

II. ආයතන සංග්‍රහය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්,

i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ පළමුවෙනි කාණ්ඩයේ I, II, III, IV, V, VI, VII, VIII, XII, XIII, XIV, XXIII, XXVII, XXIX, XXX, XXXII පරිච්ඡේද සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය පිළිබඳ දැනුම.

ii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවැනි කාණ්ඩයේ XLVII සහ XLVIII පරිච්ඡේද.

III. ආරෝග්‍යශාලා පරිපාලනය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්,

i. ආරෝග්‍යශාලා පිළිබඳ පැවැත්වෙන සාමාන්‍ය නීති රීති
ii. ආරෝග්‍යශාලා පිරිසිදුව තබා ගැනීම
iii. රෝගීන් සම්බන්ධව බලපැවැත්වෙන නිතී රීති
iv. රෝගීන්ට නියමිත ආහාරපාන ලබා ගන්නා විධි
v. ඖෂධ නිෂ්පාදනාගාර පාලනය
vi. රෝගීන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීති රීති
vii. ආරෝග්‍යශාලාවල වෛද්‍ය අධිකාරිගේ සිට අනෙකුත් කණිෂ්ඨ සේවකයින් දක්වා ඔවුන්ට අයත් රාජකාරි පිළිබඳව ඇති අවබෝධය
viii. ආරෝග්‍යශාලාවල සාමාන්‍ය පාලන කටයුතු
ix. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පාලන රෙගුලාසි
x. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් පිළිබඳ නීතිරීති
xi. ආයුර්වේද කාර්ය සංවිධාන සංග්‍රහය

1V. රාජ්‍ය භාෂා වාචික පරීක්ෂණය - සිංහල / දෙමළ (විනාඩි 15)

i. සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා :-

(අ) දෙමළ භාෂාවෙන් අසන ප්‍රශ්නවලට දෙමළ භාෂාවෙන් පිළිතුරු දීම.
(ආ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම.
(ඇ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

ii. දෙමළ භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා :-

(අ) සිංහල භාෂාවෙන් අසන ප්‍රශ්නවලට සිංහල භාෂාවෙන් පිළිතුරු දීම.
(ආ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම.
(ඇ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍යවලට සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

විභාගය සමත් වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතුය.

කුමාරි වීරසේකර,
ලේකම්.

දේශීය වෛද්‍ය ප්‍රවර්ධන ග්‍රාමීය හා ආයුර්වේද රෝහල්,
සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය,
අංක 26 , තුන්වන මහල,
ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021 ජූලි**

විභාග අංකය :

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි)
විභාගයට පෙනී සිටින මාධ්‍යය :

(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)
සිංහල-S දෙමළ - T

01. මුලකුරු සමග නම (Mr/Mrs/ Miss) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. මුලකුරු සමග නම :————. මයා/ මිය/ මෙනෙවිය
(සිංහලෙන්/ දෙමළෙන්)

03. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන්/ දෙමළෙන්) .

05. ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. i සේවා ස්ථානය හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ii සේවා ස්ථානයට අයත් පළාත :————.

07. i සේවා ස්ථානය හා ලිපිනය :————.
(සිංහලෙන්/ දෙමළෙන්)

ii දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

08. i දැනට දරන තනතුර :————.

ii පත්වීම් ලිපියේ අංකය හා දිනය :————.

09. ඔබ දැන් ඉදිරිපත් වන විෂය/ විෂයයන් :

| *අනු අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10. ඔබ මින් ඉහත විභාගයකදී පහත සඳහන් විෂයයන් එකකින් හෝ කිහිපයකින් හෝ සමත් වී තිබේද?
මුදල් රෙගුලාසි / ආයතන සංග්‍රහය /ආරෝග්‍යශාලා පරිපාලනය/ වාචික පරීක්ෂණය (දෙමළ/ සිංහල) එසේ නම් විභාග අංකය, වර්ෂය සහ මාසය සඳහන් කරන්න.

| *විෂයය* | *විභාග අංකය* | *වර්ෂය හා මාසය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද? :————.
විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද මුදල් වටිනාකම.
(බැංකු රිසිට් පත මෙහි අලවන්න)

| |
|---|
| |

ඉහත සඳහන් විස්තර නිවරදි බවත් , ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.මෙම විභාගය සඳහා පනවා ඇති නීති රීති පිළිබඳව මම එකඟ වෙමි.

..........................................,
අපේක්ෂකයාගේ / අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන:-* තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන.............. ........................................ .................................... මහතා/මහත්මිය/මෙනවිය................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

................................................,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :-....................................................

පදවි නාමය :-....................................................

ලිපිනය :-....................................................

දිනය :-....................................................

05 - 342

---

සංශෝධනයයි

**කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2019 (2020)**

අංක 2223 දරන 2021 අප්‍රේල් මස 09 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද "කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2019 (2020)" විභාග නිවේදනයේ 7 (ආ) ඡේදයෙහි අයදුම්පත් කැඳවන අවසාන දිනය පහත පරිදි සංශෝධනය කෙරේ :-

I. 7 (ආ) ඡේදයෙහි අයදුම්පත් කැඳවන අවසන් දින 2021.05.31 දක්වා දීර්ඝ කරනු ලැබේ. ඒ අනුව, අයදුම්කරුවන් 2021.05.31 වැනි දින වන විට විභාග නිවේදනය මගින් අපේක්ෂිත සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

II. මෙම විභාගය සඳහා මේ වන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් එවීමෙන් වළකින ලෙස දැනුම් දෙනු ලැබේ.

III. නිවේදනයේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2021 මැයි මස 06 වැනි දින,
රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

05 - 366

සංශෝධනයයි

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරී II ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2020**

01. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/EST/3/1/44/2012 සහ 2021.04.07 දිනැතිව **ගොවිජන සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය සංශෝධනය කිරීම** යන මැයෙන් යුතු ලිපියෙන් කරන ලද නියමය පරිදි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී බණ්ඩ 2 - සේවා ගණය (MN 05 - 2006 A) සඳහා වන බඳවා ගැනීම් පරිපාටියේ සීමිත බඳවා ගැනීම් යටතේ වන 7.3.2. හි සඳහන් සුදුසුකම් සංශෝධනය කිරීමටත් ඒ අනුව උක්ත තනතුර සඳහා වන බඳවා ගැනීමේ තරග විභාගයේ අයදුම්පත්‍ර නැවත කැඳවීමටත් අනුමැතිය ලබා දී ඇත. එකී නියමය පරිදි ක්‍රියා කිරීම පිණිස පහත සඳහන් සංශෝධනය සිදු කරනු ලැබේ.

02. අංක **2,200 - 2020 ඔක්තෝබර් මස 29** දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, **අංක 2,205 - 2020 දෙසැම්බර් මස 04 වැනි දිනැතිව සහ අංක 2,213 - 2021 ජනවාරි මස 29** දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද සංශෝධනයන් මගින්, "ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරී II ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය 2020" විභාග නිවේදනයේ අයදුම්පත්‍ර කැඳවනු ලබන අවසන් දිනය හා අනුමත බඳවා ගැනීමේ සුදුසුකම් සඳහන් ඡේද අංක 3, පහත සඳහන් ඡේද අංක 03ට අනුකූල වන පරිදි සංශෝධනය කෙරේ.

03. උක්ත නිවේදනයේ ඡේද අංක 3 ;

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් සහිත, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරක ස්ථිර කර ඇති හා වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම ;

හෝ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව **දෙවකරට නොවැඩි වාර ගණනකදී** විෂයයන් හයකින් (06) සමත් හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) **(සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර)** සමත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරේ හෝ ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර තනතුරේ ස්ථිර කර ඇති එම තනතුරක දෙවන ශ්‍රේණියේ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම ලෙස සංශෝධනය කරනු ලැබේ.

04. අයදුම්පත්‍ර කැඳවනු ලබන අවසන් දිනය වන්නේ 2021 මැයි මස 31 වැනි දින වේ.

විභාග දිනය : මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලබන දිනයක දී පැවැත්වෙනු ඇත.

අයදුම්පත් එවීම : විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට **පමණක්** ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

05. තවද අංක 2,200 - 2020 ඔක්තෝබර් මස 29 වැනි දිනැතිව සහ අංක 2,205 - 2020 දෙසැම්බර් මස 04 වැනි දිනැතිව සහ අංක 2,213 - 2021 ජනවාරි මස 29 දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද *ගැසට්* නිවේදනයන් අනුව උක්ත විභාගය සඳහා අයදුම් කරනු ලැබූ කිසිදු අයදුම්කරුවෙකු නැවත මෙම විභාගය සඳහා අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

06. මෙම නිවේදනයේ ඉහත සඳහන් ඡේද අංක 03 හා 04ට අදාළ සංශෝධන හැර 2020 ඔක්තෝබර් මස 29 දිනැති අංක 2200 දරන *ගැසට්* නිවේදනයන්හි සඳහන් අනිකුත් විධිවිධාන එලෙසින් ම බල පැවැත්වේ

ඒ. එච්. එම්. එල්. අබේරත්න,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2021 මැයි මස 06 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ.පෙ. 537,
කොළඹ 07.

05 - 367

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.